# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1818/18 – 2013 ජූලි 10 වැනි බදාදා – 2013.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/15/40/2010.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 1797/18 දරන හා 2013.02.13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත්කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 10, මරදාන, මොහිදීන් මස්ජිත් පාර, නො. 130 හි පදිංචි ඒ. පී. ප්‍රේමලාල් මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළොන්නාව, නිමාව හි පිහිටි සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබාදී ඇති අංක ඒ 3419 දරන හා 2012.12.31 දිනැති ප්‍රදානය අවලංගු කරන ලෙසට සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක ඒ 3419 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2014.02.13 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 ජූනි මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 17942 – 325 (2013/07)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
කොළොන්නාව නිමාව,
වැල්ලම්පිටිය.
2013.05.22

කම්කරු කොමසාරිස් වෙතටයි,

2013.02.13 දින අංක 1797/18 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූ ද ඒ. පී. ප්‍රේමලාල් සහ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් බැඳී සිටින්නා වූ ද 2012.12.31 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**පී. ඩී. පී. ධර්මවංශ,**
මානව සම්පත් කළමනාකාර,
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
කොළොන්නාව.

*පිටපත්* - ඒ. පී. ප්‍රේමලාල්,
අංක 130, මොහිදීන් මස්ජිත් පාර,
මරදාන, කොළඹ 10.

07 - 757

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.